**ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය - 2021**

**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

-------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට පිරිවැය රු. 14,712,522 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතියද, එම වත්කම් පිළිබඳව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. එසේම ඇති වී තිබුණු වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝෂය ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | අදාල ප්‍රත්‍යාගණන කටයුතු සිදු කර අවසන් වූ වහාම අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් විසින් 2019 වර්ෂයේදි පවත්වන ලද පාඨමාලා 67 කට අදාලව ලැබිය යුතු පාඨමාලා ගාස්තුවෙන් සියයට 15ක් වන රු. 3,381,714 ක ලැබිය යුතු මුදල්ද, එම ආයතනය විසින් මෙම ආයතනය වෙනුවෙන් පවත්වන ලද පාඨමාලාවක් සඳහා ගෙවිය යුතු වූ රු. 19,968,877 ක මුදල්ද සමාලෝචිත වර්ෂය තුල හෝ ගිණුම්ගත කිරිමට කටයුතු කර නොතිබුණි. | මෙම වටිනාකම් ගිණුම් වල ඇතුලත් කිරීමට තහවුරු කරන ලද ලේඛනයක් ගිණුම් සකස් කරන අවස්ථාව වන විට ගිණුම් අංශයට ලැබී නොමැති බැවින් ගිණුම් වල ඇතුලත් වි නොමැත. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අහෝසි වී ගිය ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු. 2,290,285ක මුදලක් හා ගුවන් විදුලි හා රූපවාහිනී වැඩසටහන් සඳහා ගෙවිය යුතු රු. 2,959,496 ක් වර්ෂ 2කට වැඩි කාලයක් තිස්සේ මුල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂයන් ලෙස පෙන්නුම් කර තිබුණද, මෙම ශේෂ සම්බන්ධයෙන් අමාත්‍යාංශය සමඟ එකඟතාවයකට පැමිණ නොතිබුණි. | අහෝසි වී ගිය අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ශේෂය පිළිබඳ එවකට පැවැති අමාත්‍යාංශය වෙත කිහිප අවස්ථාවකදීම දැනුම් දී ඇති අතර දැනට ආයතනය අයත් රේඛීය අමාත්‍යාංශය වෙතද මේ සම්බන්ධයෙන් තොරතුරු වාර්තා කර ඇත.<br>ආයතනයට ලැබිය යුතුව තිබූ ප්‍රාග්ධන මුදල් මහා භාණ්ඩාගාරයෙන් නිදහස් නොකිරීම මත තව දුරටත් ගෙවිය යුතු ශේෂ ලෙස ගිණුම් වල දැක්වේ. | ගෙවිය යුතු ශේෂයන් ගෙවීමටත් ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතන පනතේ 6 ඡේදයේ (ඊ) වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 11 ඡේදයේ (බී) වගන්තිය | 2021 දෙසැම්බර් 31 දිනට ඉතුරුම් ගිණුමේ රු.64,096,718ක ශේෂය කලමනාකරණ මණ්ඩලයේ හා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන කෙටිකාලීන හා දිගුකාලීන සුරැකුම්පත්වල ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. එම හේතුවෙන්, මෙම මුදල් ආයෝජනය කිරිමකින් තොරව වර්ෂ කිහිපයක සිටම සාමාන්‍ය ඉතිරිකිරිම් ගිණුමක පවත්වාගෙන යාම හේතුවෙන් ආයෝජනය කර ලබා ගත හැකිව තිබූ ඉහළ පොළී ආදායම අහිමි වී ගොස් තිබුණි. | ස්ථාවර තැන්පතු වල ආයෝජනය කිරීම සඳහා කළමණාකරණ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු රු.මිලියන 60 ක් ලංකා බැංකුව හෝමාගම ශාඛාවේ ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර ඇත. | පනත්හි සඳහන් විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 (2) හා (3) | 2021 දෙසැම්බර් 31 දිනට සැපයුම්කරුවන් විසින් තැන්පත් කරන ලද ආපසු ගෙවිය යුතු රු.542,000 ක් වූ තැන්පතු ශේෂය තුල වර්ෂ 02 ක් ඉක්ම වූ තැන්පතු වටිනාකම රු.117,000 ක් විය. මෙම තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව මෙම ශේෂ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. අදාල තැන්පත්කරුවන් සඳහා සිහිකැඳවීම් ලිපි යොමු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ)2020 ඔක්තෝබර් 16 දිනැති අංක 18/2020 දරන රාජ්‍ය පරිපාලන | පුහුණු පාඨමාලා පැවැත්වීමේ වගකීම රාජ්‍ය භාෂා විෂය භාර | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2020/18 අනුව හා 2007 අංක 26 දරණ ජාතික භාෂා අධ්‍යාපන සහ | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| චක්‍රලේඛයේ 4.1 ඡේදය | අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව හා ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය වෙත පවරා තිබුණද, චක්‍රලේඛ විධිවිධානවලින් බැහැරව කලමනාකරණ තීරණයක් මත නිල භාෂා හා වෘත්තිය අධ්‍යාපන ආයතනය වෙත පුහුණු පාඨමාලා පැවැත්වීමේ වගකීම පවරාදී තිබුණු අතර 2020 හා 2021 වර්ෂවලදී එම ආයතනය විසින් පිළිවෙලින් පාඨමාලා 07 ක් හා 09 ක් පවත්වා තිබුණි. | පුහුණු පනතේ බලතල ප්‍රකාරව 2019/2020 වර්ෂ වල ආයතනයේ පූර්ණ අධීක්ෂණය හා නියාමනය යටතේ පුහුණු පාඨමාලා පැවැත්වීමට කළමණාකරණ මණ්ඩල අනුමැතිය යටතේ ලියාපදිංචි වී ඇති නිල භාෂා හා වෘත්තීය අධ්‍යාපන ආයතනය මඟින් මෙම වැඩසටහන් සිදු කර ඇත. | |
| (ඇ) 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ II ඡේදය | චක්‍රලේඛය ප්‍රකාරව කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව ආයතනවලට කාර්යමණ්ඩලය බඳවා ගැනීම් හා වැටුප් හා දීමනා තිරණය කිරිමෙන් වැලකි සිටිය යුතු වුවද, එකී උපදෙස්වලට අනුගත නොවී 2020 හා 2021 වර්ෂවලදී නිලධාරින් 10 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුලදී රු. 2,899,002 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | නව රජයේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව යෝජිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට දඹුල්ල මධ්‍යස්ථානය විවෘත කිරීමට අවශ්‍යව තිබූ බැවින්, මෙම බඳවා ගැනීම් සිදු කර ඇත. තවද මෙම බඳවා ගැනීම් සඳහා ආයතනයේ උත්පාදිත ආදායමින් වැටුප් හා දීමනා ගෙවා ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) 2000 ජනවාරි 11 දිනැති පිඑෆ්/පිඊ 5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ව්‍යවස්ථාපිත ආයතනවල සේවකයන්ට දීමනා , දිරිගැන්වීම් දීමනා සහ වෙනත් මුල්‍යමය ප්‍රතිලාභ ගෙවීමේදි අමාත්‍ය මණ්ඩල හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යවරයා හෝ මහා භාණ්ඩාගාරය අනුමත කරනු ලැබූ ප්‍රතිලාභ පමණක් | ව්‍යවස්ථාපිත ආයතනයක් වුවද, මෙම ආයතනයේ සේවය කරන සේවකයින් සඳහා මාසික වැටුපට අමතරව කිසිදු දීමනාවක් හෝ රජයේ නිළධාරීන් හට හිමි අනෙකුත් වරප්‍රසාද හෝ හිමි නොවේ. ආයතනයේ උත්පාදිත ආදායම් භාවිතා කර මෙම දිරි දීමනා ගෙවීම් සිදු කර ඇත. මේ | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| ගෙවිය හැකි බව දක්වා තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී නිසි අනුමැතියකින් තොරව ආයතනයේ නිලධාරීන්ට රු.630,000 ක් දිරි දීමනා ලෙස ගෙවා තිබුණි. | සඳහා කළමණාකරණ මණ්ඩල අනුමැතියද ලැබී ඇත. |

**2.	මූල්‍ය සමාලෝචනය**
**---------------------**

**2.1	මූල්‍ය ප්‍රතිඵල**
**--------------**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 13,849,346 ක අලාභයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.7,946,868 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 21,796,214 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලද පුනරාවර්තන ප්‍රදාන රු.9,012,909 කින් සහ පුහුණු වැඩසටහන් ආදායම රු.6,350,425 වැඩි වුවද, පරිපාලන වියදම් සහ පුහුණු වැඩසටහන් වියදම් පිළිවෙලින් රු.7,292,031 කින් හා රු. 29,780,921 කින් වැඩිවී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.	මෙහෙයුම් සමාලෝචනය**
**----------------------------**

**3.1	මෙහෙයුම් අකාර්යක්ෂමතා**
**--------------------------**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩ තහනමකට ලක් වූ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ පරිපාලන නිලධාරිනිය විධිමත් විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමකින් තොරව නැවත සේවයේ පිහිටුවා තිබූ අතර, වැඩ තහනමට ලක් වූ කාලයට අදාලව වැටුප් හා දීමනා ලෙස රු. 666,026ක මුදලක් ගෙවා තිබුණද. සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පරීක්ෂණ කටයුතු ආරම්භ කර නොතිබුණි. | 2020.01.31 රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු විෂය භාර රාජ්‍ය අමාත්‍යවරයාගේ හා රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ලිපියද සලකා බලා නැවත සේවයේ පිහිටුවා අදාල වැටුප් හා දීමනා ගෙවා ඇත. 2021.07.15 දින කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. | වැඩ තහනමකට ලක් වූ නිලධාරින් සම්බන්ධ විනය පරීක්ෂණ පැවැත්වීම කඩිනම් කළ යුතුය. |

**3.2	ප්‍රසම්පාදන කළමනාකරණ**
**------------------------------**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2010 මැයි 14 වන දිනැති අංක CA/1/17/1 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කාර්යාල හැකිතාක් දුරට රජයේ ගොඩනැගිලිවල පවත්වාගෙන යායුතු බව අවධාරණය කර තිබියදී සහ | මෙම ගොඩනැගිල්ල කුලියට ගැනීම සඳහා 2022.12.31 දක්වා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලැබී ඇත. ආයතනය ස්ථාපිත කිරීම සඳහා සුදුසු රජයේ ගොඩනැගිල්ලක් සොයාගත නොහැකි වූ බැවින් තව | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| කළමනාකරණ මණ්ඩලය විසින්ද කාර්යාලය පවත්වාගෙන යාමට පමණක් ඉඩ පහසුකම් ඇති ගොඩනැගිල්ලක් ලබා ගන්නා ලෙස අවධාරණය කර තිබිදියදී, දැනට ආයතනය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ ගිවිසුම් කාලය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා නොගෙන වසර දෙකක් සඳහා දිර්ඝ කර කාර්යාල ගොඩනැගිල්ල වෙනුවෙන් වාර්ෂිකව රු .16,200,000 ක කුලී මුදලක් ගෙවා තිබුණි. නිලධාරීන් 32 ක ගෙන් යුතු සුළු කාර්ය මණ්ඩලයක් වෙනුවෙන් සහ පුහුණු පාඨමාලා පැවැත්වීමට දේශන ශාලා සකස් කිරීම වෙනුවෙන් රු.4,140,643 ක මුදලක් වැය කර තිබුණද, පුහුණු පාඨමාලා මුදල් ගෙවා වෙනත් ස්ථානවල පැවැත්වීම හේතුවෙන් ගොඩනැගිල්ල උපරිම ධාරිතාවයෙන් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | දුරටත් මෙම ගොඩනැගිල්ලෙහි ආයතනය පවත්වාගෙන යනු ලබයි. ආයතනය මඟින් සිදු කරනු ලබන භාෂා පුහුණු පාඨමාලා සඳහා මෙම ගොඩනැගිල්ල යොදා ගනු ලබන අතර, ආයතනයේ සාමාන්‍ය පුහුණු පාඨමාලා පැවැත්වීම වෙනුවෙන් වෙනත් ස්ථාන සඳහා මෙම වර්ෂය තුල මුදල් ගෙවා නොමැත. | |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරි සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුලදි පෙර පාසල් ගුරුවරුන් සඳහා පැය 100 භාෂා පාඨමාලා 4 ක්, පිරිවෙන් අධ්‍යාපනය ලබන බෞද්ධ භික්ෂූන් වහන්සේලා 200 ක් වෙනුවෙන් වැඩසටහන් 5ක්, දෙමල භාෂා පාඨමාලා වෙනුවෙන් විෂය නිර්දේශ 4 ක් සකස් කිරිම, සිංහල ඩිප්ලෝමා මොඩියුලයක් පිළියෙල කිරිම හා දෙවන භාෂාව ඉගැන්වීමේ සහතිකපත්‍ර සඳහා වූ විෂය නිර්දේශ නවීකරණය කිරිම යන කාර්යයන් 05 ක් ඉටු කිරිම සඳහා රු. 1,569,000 ක පිරිවැයක් දැරීමට සැලසුම් කර තිබුණද, එකි කාර්යයන් කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණි. | 2021 වර්ෂයේදි කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් එකම ස්ථානයකදී පාඨමාලා පැවැත්වීම දුෂ්කර වු බැවින් පුහුණු පාඨමාලා සංවිධානය නොකරන ලදි. එමෙන්ම සම්පත් දායකයන් කැඳවා ගැනීම අපහසු වු හෙයින් දෙමල භාෂා විෂය නිර්දේශය සකස් කිරිම සිංහල ඩිප්ලෝමා මොඩියුලයක් සකස් කිරිමත් දෙමල භාෂා විෂය නිර්දේශය නවීකරණය කිරිමත් ප්‍රමාද කිරිමට සිදු විය. | සැලැසුම් කරන ලද කාර්යයන් ක්‍රියාත්මක කිරිමට කටයුතු කළ යුතුය. |